**දෙවිනුවර ප්‍රාදේශීය සභාව - 2022**

**-------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

දෙවිනුවර ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට දෙවිනුවර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම් අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව ප්‍රාදේශිය සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසානයට සභාව සතු රු.61,870,000 ක වටිනාකමින් යුතු ගොඩනැඟිලි 07 ක් ඉඩම් හා ගොඩනැඟිලි යටතේ ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදි කර ඇති බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ආ) | සභාව විසින් පවත්වාගෙන යනු ලබන රු.25,000,000 ක වටිනාකමින් යුතු ස්ථාවර තැන්පතු 03 වෙනුවෙන් ලැබිය යුතු පොලිය රු.672,699 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | නිවැරදි කර ඇති බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය අවසානයට පොදු ගබඩා තොග වටිනාකම රු.557,181 ක් වැඩියෙන් දක්වා තිබුණි. | නිවැරදි කර ඇති බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ඈ) | සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉකුත් වර්ෂයේ සභාව විසින් ක්‍රියාත්මක කරන ලද විවිධ ඉදිකිරීම් කර්මාන්ත 06 ක ගෙවිය යුතු වියදම වෙනුවෙන් කර්මාන්ත ණයහිමියන් රු.555,507 ක් වැඩිපුර ගිණුම්ගත කර තිබුණි. | නිවැරදි කර ඇති බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ඉ) | ඉකුත් වර්ෂයේ අපහරණය කරන ලද රු.476,499 ක් වටිනා ට්‍රැක්ටර් ට්‍රේලරය හා කුබෝටා අත් ට්‍රැක්ටරය සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් මෝටර් රථ හා කරත්ත යටතේ ගිණුම්ගත කර තිබුණි. | නිවැරදි කර ඇති බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ඊ) | සමාලෝචිත වර්ෂයේදී සභා බල ප්‍රදේශයේ සිදු කරන ලද ඉඩම් වෙන්දේසි 02 කින් ලැබිය යුතු රු.1,258,930 ක් වූ 1% ගාස්තු ලැබිය යුතු ආදායම ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදි කර ඇති බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (උ) | සමාලෝචිත වර්ෂය අවසානයට ඉකුත් වර්ෂයට අදාලව ලැබිය යුතු රු.274,000 ක් වූ මුද්දර ගාස්තු ලැබිය යුතු ආදායම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදි කර ඇති බව | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |

**1.6.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| යාවත්කාලීන කරන ලද ස්ථාවර වත්කම් ලේඛනය, හිමිකම් ඔප්පු යනාදී තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.122,082,889 ක් වූ ගිණුම් විෂයයන් 04 ක් විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතු වේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 20,240,880 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 19,207,364 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම රු. | බිල් කළ ආදායම රු. | රැස්කළ ආදායම රු. | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය රු. | ඇස්තමේන්තුගත ආදායම රු. | බිල් කළ ආදායම රු. | රැස්කළ ආදායම රු. | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය රු. |
| (i) | වරිපනම් හා බදු | 2,923,135 | 1,924,480 | 1,380,399 | 5,946,297 | 3,037,238 | 3,351,577 | 3,123,716 | 5,402,216 |
| (ii) | කුලී | 26,036,460 | 4,388,695 | 3,892,244 | 14,640,140 | 26,322,260 | 5,388,161 | 3,030,691 | 14,143,689 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 5,075,500 | 810,040 | 884,225 | 156,790 | 5,410,350 | 857,453 | 683,228 | 230,975 |
| (iv) | වෙනත් ආදායම් | 7,314,800 | 1,338,664 | 917,574 | 516,556 | 7,401,000 | 5,049,117 | 4,953,651 | 95,466 |
| | | 41,349,895 | 8,461,879 | 7,074,442 | 21,259,783 | 42,170,848 | 14,646,308 | 11,791,286 | 19,872,346 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය ආරම්භයට හිඟ වරිපනම් බදු ශේෂය රු.5,196,765 ක් වූ අතර, වර්ෂය අවසානයට එම ශේෂය රු.5,866,493 ක් විය. | ජංගම සේවා සහ ප්‍රචාරණ කටයුතු සිදු කිරීම මඟින් හිඟ අය කිරීමේ වැඩසටහනක් සහ හිඟ දේපල සඳහා වරෙන්තු පිළියෙල කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට නියමිතව ඇති බව. | හිඟ ආදායම් කඩිනමින් අය කර ගත යුතු වේ. |
| (ආ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තිය ප්‍රකාරව සභා බලප්‍රදේශයේ දියුණු කළ ප්‍රදේශ ලෙස ග්‍රාම නිලධාරී වසම් 16 ක් හඳුනාගෙන අංක 1980 හා 2016 අගෝස්තු 12 දිනැති ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත්කර තිබුණද විගණිත දිනය වූ 2023 ජනවාරි 30 වන විටත් දේපළ තක්සේරු කර වරිපනම් බදු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | තක්සේරු දෙපාර්තමේන්තුව වෙත ලිඛිත ඉල්ලීම් ඉදිරිපත් කර ඇති බව. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | 1946 අංක 30 දරන බදු හා තක්සේරුකරණ පනතේ 20 වන වගන්තිය ප්‍රකාරව වරිපනම් දේපළ වසර 05 කට වරක් තක්සේරු කර වාර්ෂික වටිනාකම මත බදු අය කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂය තුළදීද 2011 වර්ෂයේ වරිපනම් දේපළ තක්සේරුව මත පදනම්ව වරිපනම් බදු අය කරමින් තිබුණි. | තක්සේරු දෙපාර්තමේන්තුව වෙත ලිඛිත ඉල්ලීම් ඉදිරිපත් කර ඇති බව. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ඈ) | සභාව සතුව පවතින කඩ කාමර බදු දී තිබූ, බදුකරුවන් 84 දෙනෙකුගෙන් රු.13,810,794 ක කඩ කාමර කුලී අයවීමට තිබුණි. | මුදල් කමිටු තීරණය පරිදි ඉදිරියේ දී කටයුතු කරන බව. | හිඟ ආදායම් කඩිනමින් අය කළ යුතු වේ. |
| (ඉ) | 2023 පෙබරවාරි 02 දින වන විට සභාව සතු වෙළෙඳ සංකීර්ණ 04 ක කඩ කාමර 73 කට අදාලව බදු ගිවිසුම් යාවත්කාලීන කර නොතිබුණි. | ගිවිසුම් ගත වීමට කුලී හිමියන් ලිඛිතව දැනුවත් කර ඇති බව. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ඊ) | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට ලැබිය යුතු උසාවි දඩ රු.1,160,790 ක් හා මුද්දර ගාස්තු රු.68,528,018 ක් විය. | අදහස් දක්වා නොමැත. | හිඟ ආදායම් කඩිනමින් අය කළ යුතු වේ. |
| (උ) | දෙවිනුවර ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි, හෝටල් හා ආපනශාලා 05 කින් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වන වගන්තිය ප්‍රකාරව ගාස්තු අය කර නොතිබුණි. | 2023 වර්ෂයේදී මෙම හෝටල් වලින් 1% ගාස්තු අයකිරීමට කටයුතු කරන බව. | පනත අනුව අතුරු ව්‍යවස්ථා පනවා ගාස්තු අය කළයුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | --------------------- | ------------------------- | ----------- |
| (අ) | සභා බල ප්‍රදේශය තුළ එක්රැස් කරන කසළ ප්‍රමාණය පිළිබඳව දත්ත පවත්වා ගැනීමටත් දිරාපත් වන කසළ භාවිතා කර කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය කිරීමටත් නොදිරන කසළ ප්‍රතිචක්‍රීකරණයට යොමු කිරීමත් සඳහා ස්ථිර හා විධිමත් කසළ කළමනාකරණ ව්‍යාපෘතියක් සභාව විසින් ක්‍රියාත්මක කර නොතිබුණු අතර ඒ වෙනුවට දෛනිකව එක්රැස් කරන දිරාපත් වන කසළ වැල්ලමඩම මෝලවත්ත නමැති පෞද්ගලික ඉඩමකට බැහැර කරමින් තිබුණි. | සුදුසු ඉඩමක් ලබා ගැනීමෙන් පසුව කසළ කළමනාකරණ ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට සැලසුම් කරන බව. | ස්ථිර හා විධිමත් කසළ කළමනාකරණ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ආ) | දිරාපත් වන කසළ හා දිරාපත් නොවන කසළ මිශ්‍ර කර මාර්ගය දෙපස ප්‍රජාව විසින් ගෙනවිත් දමන කසළද වෙරළ තීරයට ආසන්න ජනාකීර්ණ වැල්ලමඩම මෝල්වත්ත නමැති ප්‍රදේශයක පිහිටි පෞද්ගලික ඉඩමට බැහැර කරන බැවින් කසළ අංගනයට පොලිතීන් මිශ්‍ර කසළද බැහැර කර පස් දමා වැසීම සිදු කර තිබුණි. | ජනතාව දැනුවත් කර කසළ මෙම ඉඩමට දැමීම අවම කර ඇති බව. | ස්ථිර හා විධිමත් කසළ කළමනාකරණ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කළ යුතු වේ. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේදී සභාව සතු බැකෝ යන්ත්‍රය එක්තරා නියෝජිත ආයතනයකට අලුත්වැඩියාව සඳහා රු.692,028 ක් ගෙවීම් සිදු කර තිබූ අතර අලුත්වැඩියා කටයුතු මාස 04 කින් ප්‍රමාද වීම නිසා සභාවේ දෛනික කටයුතු සිදු කර ගැනීමට බැකෝ යන්ත්‍ර කුලියට ලබා ගැනීමට රු. 617,680 ක් වැය කිරීමට සිදුවී තිබුණි. | දකුණු පළාත් යාන්ත්‍රික ඉංජිනේරු නිර්දේශ මත ගෙවීම් කටයුතු සිදු කරන ලද බව. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ආ) | වාර්ෂිකව පවත්වනු ලබන ඇසළ සල්පිලෙහි තාවකාලික කඩ හා බිම් අල්ලි අලෙවි කිරීමේ ක්‍රියාවලිය ඉතා අවිධිමත් ලෙස විනිවිදභාවයකින් තොරව, වසර ගණනාවක් තිස්සේ කඩ හා බිම් අල්ලි අලෙවි කිරීමේදී සිදුව තිබූ අක්‍රමිකතා නිසා රු.981,430 ක මුදලක් සභා අරමුදලට බැරවී නොතිබුණි. | පළාත් පාලන දෙපාර්තමේන්තුව ලබා දෙන නිර්දේශ පරිදි ඉදිරියේදී සිදු කරන බව. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ඇ) | 2014 ඔක්තෝබර් 13 දින ආදේශක වැඩ ක්ෂේත්‍ර කම්කරුවෙකු බඳවා ගෙන 2020 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසන් වන විට රු.1,244,917 ක් වැටුප් හා දීමනා සභා අරමුදලින් ගෙවා තිබුණද ඔහු විසින් කිසිඳු රාජකාරියක් ඉටු නොකරන බව විගණනයට නිරීක්ෂණය විය. | 2023 මාර්තු 20 දක්වා දිවා මුර සේවයේ රාජකාරී කටයුතු සිදුකර ඇති බවත්, 2023 මාර්තු 20 දින සිදු කළ නව රාජකාරී පැවරීම ඔහු විසින් මේ වන විටත් භාර ගෙන නොමැති බව. | තනතුරට අදාළ නිශ්චිත රාජකාරී පැවරිය යුතු වේ. |

## 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක PR/01/01 හා 2010 අගෝස්තු 17 දිනැති චක්‍රලේඛය ප්‍රකාරව වීථි පහන් ස්ථාපනය නොකිරීම හේතුවෙන් සභා අරමුදලින් දරන ලද රු.4,038,100 ක වියදමක් ප්‍රතිපූර්ණය වී නොතිබුණි. | ජනතාවගේ ඉල්ලීම් සඳහා ප්‍රමුඛතාවය ලබා දී අත්‍යාවශ්‍ය වීථි පහන් ස්ථාපනය කිරීම සිදු වීම නිසා චක්‍රලේඛයට පටහැනිව ක්‍රියා කිරීමට සිදුව ඇති බව. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ආ) | ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් නාගරික සීමාව තුළ අළුතින් ඉදිකර තිබූ ගොඩනැගිලි 04 කට අදාළව සංවර්ධන බලපත්‍ර ලබා ගෙන නොතිබූ අතර මෙම ඉදිකිරීම් | නීතිමය කටයුතු සිදු කිරීම සඳහා උපදෙස් පතා නාගරික සංවර්ධන | ගැසට් නිවේදනය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

| | |
|---|---|
| සම්බන්ධයෙන් පරීක්ෂා කර බලා නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් හා සංවර්ධන නියෝග /රෙගුලාසි ඇතුළත් 2021 ජූලි 08 දිනැති අංක 2235/54 ගැසට් නිවේදනයේ 02 වන උප ලේඛනය ප්‍රකාරව කටයුතු කර රු.6,864,000 ක ගාස්තු අය කර එම ඉදිකිරීම විධිමත් කිරීමට හෝ ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි. | අධිකාරිය වෙත යොමු කර ඇති ලිපියට පිළිතුරු ලද පසු ඒ පරිදි ඉදිරියේදී කටයුතු කරන බව. |

### 3.4 මතභේදයට තුඩු දෙන ගනුදෙනු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දෙවිනුවර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ මහහේන යක්දෙහිගහහේන ස්ථානයේ වාණිජ කටයුත්තක් සඳහා වර්ග මීටර් 474 ක ගොඩනැගිල්ලකට අදාළ අයදුම්පත නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් හා සංවර්ධන නියෝග / රෙගුලාසි ප්‍රකාරව නාගරික සංවර්ධන අධිකාරියට යොමු කළ යුතු වුවද දෙවිනුවර ප්‍රාදේශීය සභාවේ සභාපති විසින් සැලසුම් කමිටුවට යොමු නොකර ව්‍යාජ ලෙස අනුමත කර තිබුණි. | ගොඩනැගිලි සැලසුම අවලංගු කරන ලද බව. | ගැසට් නිවේදනය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ආ) | සභා බල ප්‍රදේශයේ දෙවිනුවර තල්පාවිල මාර්ගයට යාබදව පිහිටි අක්කර 01 රූඩ් 01 පර්චස් 34.75 ක් වූ පිඹුරු අංක 9142 දරන ඉඩම පෞද්ගලික පාර්ශවයක් විසින් වෙන්දේසි කර විකිණීම සඳහා ඉදිරිපත් කර තිබූ අයදුම්පත්‍රයට අදාලව කට්ටි සැලැස්ම සභාපතිවරයා විසින් ව්‍යාජ ලෙස අනුමත කර තිබුණි. | ගාස්තු අය කර ගැනීමට කටයුතු කරන බව. | අනුමැතිය ලබා දීමට පෙර මූලික සැලසුම් නිරාකරණය ට අදාල කොන්දේසි ඉටුකළ යුතු වේ. |

### 3.5 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේදී කොන්ක්‍රීට් කාණු 03 ක් ඉදිකිරීමේදී හැඩයම් සකස් නොකළ කොටස් සඳහා හැඩයම් වර්ග මීටර් 40.3 සඳහා වැඩිපුර රු.59,279 ක් ගෙවා තිබුණි. | වැඩිපුර ගෙවන ලද මුදල් ඉදිරියේදී අය කර ගැනීමට කටයුතු කරන බව. | ඉටුකළ වැඩ සඳහා පමණක් ගෙවීම් කළ යුතු වේ. |

### 3.6 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දෙවිනුවර ප්‍රාදේශීය සභාවට කම්කරුවන් වශයෙන් බඳවාගෙන තිබූ සේවකයින් 09 දෙනෙකු ස්ථිර සේවයට පත්කර තිබුණද බඳවා ගැනීමට අදාලව ඉදිරිපත් කරන ලද අධ්‍යාපන සහතික 2023 ජනවාරි 31 දින වන විටත් අදාල ආයතනවලින් සනාථ කර ගෙන නොතිබුණි. | තිදෙනෙකුගේ සහතික මේ වන විට සනාථ කර ඇති බවත්, ඉතිරි සහතික සනාථ කිරීම සඳහා නැවත ලිපි යොමු කර ඇති බව. | සහතික සනාථ කර ගත යුතු වේ. |
| (ආ) | 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ ඇමුණුම ප්‍රකාරව මානව සංවර්ධන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | මානව සංවර්ධන සැලැස්ම මෙම වර්ෂය සඳහා පිළියෙල කරමින් පවතින බව. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සභාවේ වැඩ ක්ෂේත්‍ර කම්කරුවන් 03 දෙනෙකු සහ සෞඛ්‍ය කම්කරුවෙකු වෙත තනතුරට අදාල නියමිත රාජකාරි පැවරීමකින් තොරව වැටුප් හා දීමනා ලෙස 2020 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා රු.5,113,510 ක් සභා අරමුදලින් වැය කර තිබුණි. | ඔවුන්ගේ නිපුණතාවය සහ දක්ෂතාවය සළකා බලා නවක නිලධාරීන් සමඟ කාර්යාල කටයුතුවල සහායට යොදවන ලද බව. | තනතුරට අදාල නියමිත රාජකාරි පැවරීය යුතු වේ. |